www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආඥාදායකත්වයේ දුර්ගන්ධය

**The stench of dictatorship**

**2010 ඔක්තෝබර් 01**

යුද විරෝධී ක්‍රියාකාරීන්ට එරෙහිව පසුගිය සතියේදී එෆ්බීඅයි "ඇමෙරිකන් රහස් ඔත්තු සේවය" විසින් දියත් කල වැටලීම් සමස්ත කම්කරු පන්තියටම තර්ජනාත්මක අනතුරු ඇඟවීමකි. මෙම පොලිස්-රාජ්‍ය පියවර පෙන්නුම් කරන්නේ නිදහස් භාෂනයට හා දේශපාලන සමාගමයට ඇති අයිතිය ඇතුලු මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් එක්සත් ජනපදය තුල වල දමා ඇති ප්‍රමානයේ තරමයි.

නිදහස් මගේ සමාජවාදී සංවිධානයේ (එෆ්ආර්එස්ඕ) ප්‍රධාන සාමාජිකයන්ගේ නිවෙස්වලට කඩා වැදීමටත් ඔවුන්ගේ ලිපි ලේඛන, පරිඝනක, ජංගම දුරකතන, කැමරා සහ තවත් පෞද්ගලික හා දේශපාලනික ලියවිලි අත් අඩංගුවට ගැනීමටත් ඔබාමා පාලානාධිකාරිය විසින් නියෝග පනවන ලදි. අත් අඩංගුවට ගත් අය ඔක්තෝබර් 12 වෙනි දින ඉහල ජූරියක් හමුවට පැමිනවීමට සැලසුම් කර ඇති අතර ඔවුන් එහිදී ත්‍රස්තවාදය සඳහා "ද්‍රව්‍යමය ආධාර දීම" වෙනුවෙන් සාපරාධී චෝදනාවන්ට මුහුන පානු ඇත.

මෙම ක්‍රියාවන්ට හේතුභූත කාරනාව කුමක්ද? එක්සත් ජනපදය නිල වසයෙන් "ත්‍රස්තවාදීන්" ලෙස හඳුන්වන මෙම කන්ඩායම් අධීක්ෂනය කිරීම සම්බන්ධයෙන් අනුමාන සහ සනාථ නොකල චෝදනා තිබේ. දමා ගසා තිබේ. මෙම අධීක්ෂනයන් මුලුමනින්ම මෙහෙයවා ඇත්තේ දෙන ලද ඕනෑම අවස්ථාවකදී එක්සත් ජනපද විදෙස් පිලිවෙතේ අවශ්‍යතාවන් මගිනි. මෙහි අර්ථය වන්නේ, මෙම සංවිධාන "ත්‍රස්තවාදීන්" වෙනු ඇත්තේ මැද පෙරදිග, ලතින් ඇමෙරිකාව හෝ ලෝකයේ අනෙකුත් කොටස් තුල එක්සත් ජනපද අවශ්‍යතාවන්ට ඔවුන් සහය දෙන්නේ ද නැතහොත් විරුද්ධ වන්නේද යන්න මතය.

ප්‍රහාරයට ගොදුරුව පවතින්නේ හුදෙක් එක් සංවිධානයක් නොවේ. ආන්ඩුව සහ එහි මිලිටරි-පොලිස් ආයතනවල පෙල ගැස්ම එල්ල වී පවතින්නේ එක්සත් ජනපදය තුල විරුද්ධ කොටස් සාපරාධීකරනය කිරීම පුලුල් කිරීමට ය.

එෆ්බීඅයි සහ ඔබාමා පාලන තන්ත්‍රයේ මෙම ක්‍රියාව මුට්ටිය දමා බැලීමකි. මහජනයාගෙන් හා මාධ්‍යයෙන් එන ප්‍රතිචාරය පිලිබඳ මිනුම් දන්ඩක් මෙන්ම නිදර්ශකයක් මේ හරහා තනා ගැනීමට ඔවුහු බලාපොරොත්තු වෙති. එකහෙලාම මුනිවත රකින මාධ්‍යවල ප්‍රතිචාර සමඟ නම් පාලානාධිකාරිය නිසැකවම තුටුපහටු වනු ඇත. මෙම සිද්ධිය පුවත්පත් විසින් වලලා දැමූ අතර රූපවාහිනී ප්‍රවෘත්ති එය ආවරනය නොකලේය. ලිබරල් සංස්ථාපිතයේ හඬ, *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත එහි ඇතුලු පිටුවක කුඩා ලිපියක් පල කලේය.

"වාම" යැයි කියාගන්නා පුවත්පත් ද ගොලුවත රැකීය. නේෂන් සඟරාව එහි වෙබ් අඩවියේ ලිපියක් හෝ විවේචනයක් තවම පලකර නොමැත. මෙම ප්‍රතිචාරය අරුමයක් නොවේ. නේෂන් සඟරාව සහ ඒ වටා පෙලගැසුන ඩිමොක්‍රටික් හිතැති කවය එක්සත් ජනපදයේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් තවදුරටත් හංග කර දැමීමට සහ කම්කරු පන්තිය මත ප්‍රහාර එල්ල කිරීමට, යුද්ධය ව්‍යාප්ත කිරීම ද ඇතුලත්ව ඔබාමා පාලන තන්ත්‍රයට හා එහි ප්‍රතිපත්තීන්වලට අනුබල සපයයි. ආන්ඩුවේ සැබෑ ස්වරූපය මොනයම්ම හෝ අයුරකින් නිරුවත් වීම වැලක්වීම ඔවුන්ගේ මූලික එල්ලය යි.

ආන්ඩුවේ විරුද්ධවාදීන් පිලිබඳ ඔත්තු බැලීමට, සිරගත කිරීම, වධ බන්ධනයට ලක් කිරීම හා ඝාතනය කිරීමෙහි ලා රාජ්‍ය බලය ව්‍යාප්ත කිරීමේදී ඔබාමා පාලන තන්ත්‍රය සෑම පෙරමුනකදීම බුෂ්ගේ පිලිවෙත අඛන්ඩව පවත්වා ගෙන ගොස් තිබේ. පොලිස් කඩාපැනීම සිදු වූයේ ෆේස්බුක්, ස්කයිප් සහ බ්ලැක්බෙරි සංනිවේදන ජාලය ද ඇතුලත් වන පරිදි ආන්ඩුවේ ඔත්තු සේවය පුලුල් කිරීමට පාලන තන්ත්‍රය මං සොයමින් සිටින්නේය යන්න අනාවරනය වී තිබියදීම ය. බලහත්කාරයෙන් යටත් කරගැනීම, වධබන්ධනයට ලක් කිරීම සහ අනවසරව රහසින් දුරකථන සංවාදවලට සවන්දීම පිලිබඳ උසාවි නියෝග වැලැක්වීමට "රාජ්‍ය රහස්" කතාන්තරය එය පුන පුනා මතුකලේය.

ජනාධිපතිගේ තනි අධිකාරයෙන්, එක්සත් ජනපද පුරවැසියන් ද ඇතුලත්ව ඕනෑම අයෙකු

ඝාතනය කිරීමට ආන්ඩුවට ඇති අයිතිය පාලන තන්ත්‍රය විසින් සහතික කොට තිබේ. එය, බුෂ් පාලනාධිකාරය විසින් සම්මත කරන ලද දේශප්‍රේමී පනත සහ අනෙකුත් ප්‍රජාතන්ත්‍ර-විරෝධී නීති පැනවීම් තව දුරටත් පුලුල් කර ඇත. තවද එක්සත් ජනපදය විදේශයන්හි ගෙන යන යුද ක්‍රියාදාමයන්ගේ සාපරාධීභාවය අනාවරනය කිරීමේදී එහි කාර්යභාරය වෙනුවෙන් විකිලීක්ස් වෙබ් අඩවිය ඉලක්ක කොට භය ගැන්වීම හා අපකීර්තියට ලක් කිරීමේ ගෝලීය මෙහෙයුමක මැද පාලනාධිකාරිය සිටී.

ඇමෙරිකානු ප්‍රජාතන්ත්‍රවාදය කාබාසිනියා කිරීම අන්තර් සම්බන්ධිත සන්තතීන් යුගලයකට සම්බන්ධ කරනු ලබයි. පලමුවැන්න වන්නේ, ව්‍යාප්ත වෙමින් පවත්නා එක්සත් ජනපද නීත යුද ක්‍රියාදාමයන් ලෝක මහජනතාව සමඟ වඩාත් සෘජු ඝට්ටනයකට පමුනුවා ගැනීම යි. වධ බන්ධන යොදා ගැනීම, ගුවන්තනමෝ බේ රැඳවුම් කඳවුර ස්ථාපිත කිරීම සහ අනෙකුත් ප්‍රජාතන්ත්‍ර-විරෝධී පියවරයන් මුලුමනින්ම ගත් කල මෙම ලේවැකි යුද්ධවල සෘජු ප්‍රතිඵලයයි. මෙම උපායන්ම එක්සත් ජනපදය තුල දේශපාලන විරුද්ධත්වයට එරෙහිව ඉතා ඉක්මනින්ම යොදා ගනු ඇත.

මේ මොහොතේදී ඔබාමා ඇෆ්ගනිස්ථානයේ සහ පකිස්ථානයේ ලේවැකි ආක්‍රමනයක් මෙහෙයවමින් සිටින අතර ගෝලීය වහ්නිජාලයකට මුලපිරීමට තර්ජනය කරමින්, චීනය, ඉරානය සහ අනෙකුත් බලවතුන් සමඟ ආතතීන් සංකේන්ද්‍රනය කරමින් සිටී. සෑම අධිරාජ්‍යවාදී බලවතෙකුම තමන්ගේ අවශ්‍යතාවන්ට එරෙහිව සිටින විරුද්ධ පාර්ශවයන් මැඩපැවත්වීමට යොදා ගන්නා චාරිත්‍රානුකූල විධිය "ත්‍රස්තවාදයට" එරෙහි ලේබලය ඇලවීමෙන් තනා ගෙන තිබේ. කෙසේවතුදු මෙම වචනයට ["ත්‍රස්තවාදය"] මොනයම්ම හෝ තේරුමක් තිබේනම් නිශ්චිතව එය යෙදිය යුත්තේ එක්සත් ජනපද ආන්ඩුවටමය. එක්සත් ජනපදයේ වායු සමනය කල කාමර තුල වාඩි වී සිටින සීඅයිඒ නිලධාරීන් විසින් පාලිත ලෝකයේ ඈත ප්‍රදේශවල සිටින අසරන සිවිල් ජනයාට එරෙහිව එවන නියමු රහිත යානාවලින් ප්‍රහාර එල්ල කරන්නේ මෙම එක්සත් ජනපදයම නිසාවෙනි.

දෙවැනි කාරනය වන්නේ, ඇමෙරිකන් ප්‍රජාතන්ත්‍රවාදයේ කඩා වැටීම, එක්සත් ජනපදය තුලම වැඩෙන සමාජ අර්බුදයට නොවෙන් කල හැකි සේ බැඳී තිබීමයි. එක්සත් ජනපදයේ අසමානතාව වාර්තාගත ඉහල අගයන්වල පවතී. මූල්‍ය කතිපයාධිකාරීන් ඔවුන් විසින්ම නිර්මානය කල අර්බුදයක් යෝධ ලෙස තමන්ගේ මඩිය තරකර ගැනීමට ගසා කා තිබේ. දැන් එය ඉල්ලා සිටින්නේ එම බිල්පත, වැටුප් කප්පාදු, දැවැන්ත විරැකියාව සහ පටි තද කිරීමේ පියවරවල රූපාකාරයෙන් කම්කරු පන්තියෙන් අයකර ගන්නා ලෙසයි.

සමාජවාදී සමානතා පක්ෂය එහි වැඩපිලිවෙල වන, *ධනවාදයේ කඩා වැටීම සහ එක්සත් ජනපදයේ සමාජවාදය සඳහා අරගලය* හිදී සඳහන් කල පරිදි, "සමාජ අසමානතාවේ වර්ධනය ප්‍රජාතන්ත්‍රවාදය සමඟ එකිනෙකට නොපෑහේ. නව කතිපයාධිකාරය ඉදිරයට එමින් තිබෙන්නේ පාලක පන්තියේ උපකරනයක් වසයෙන් අන් කවරදාටත් වඩා විවෘත ලෙස ක්‍රියාත්මක වන රාජ්‍යයක් තුල බිහි වූ ආන්ඩුවක කතිපයාධිකාරී මූලධර්මය ද සමගිනි."

එහි ප්‍රතිපත්තීන් මහජනතාවගෙන් එන විරුද්ධත්වයෙන් අභියෝගයට ලක් වන බව පාලක පන්තිය යහමින් දැනුවත්ව සිටී. මොනයම්ම හෝ වියදමකින් තමන් අයථා ලෙස ඉපැයූ ධනය පවත්වා ගැනීමට හා ඉහල දමා ගැනීමේ අදිටන් කොට සිටින එය, දේශපාලන මර්දනයේ පෙර නුවූ විරූ නිර්වස්ත්‍ර ක්‍රමෝපායන්වල පිහිටාධාරය සොයනු ඇත.

එෆ්ආර්එස්ඕ සංවිධානය සහ අනෙකුත් එවැනි සංවිධානවල මාවෝවාදී සහ ජාතිකවාදී දේශපාලනය සමඟ සමාජවාදී සමානතා පක්ෂයට ප්‍රධාන මූලධර්මාත්මක දේශපාලනික වෙනස්කම් තිබියදීම එය (සසප) ඔවුන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් කොන්දේසි විරහිතව ආරක්ෂා කරයි. එක්සත් ජනපද ආන්ඩුව විසින් දියත් කර තිබෙන බිය ගැන්වීමේ හා කඩාපැනීමේ මෙහෙයුම ද පරීක්ෂනය ද වහා නවතා දමන ලෙස අපි බල කරමු.

යුද්ධය, අසමානතාව සහ ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ට බැටදීම යනාදිය බැංකු සහ යෝධ සංගතවල දේශපාලනික හා ආර්ථික ආඥාදායකත්වය හරහා පවත්වා ගෙන යන ධනවාදී පද්ධතියේ සමස්ත නිෂ්පාදනය යි. මේ අනුව ගත් කල, මෙම අයිතීන් ආරක්ෂා කිරීමේ සටන බැඳී පවතින්නේ සමාජවාදී වැඩපිලිවෙලක පදනම මත කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලනික බලගැන්වීමත් සමඟය. එවැනි අරගලයක් ගෙන යාමට අවශ්‍ය සියලු දෙනාගෙන් සසප ක්‍රියාමාර්ගය අධ්‍යනය කරන ලෙසත් සමාජවාදී සමානතා පක්ෂයට බැඳීමේ තීන්දුව ගන්නා ලෙසත් සසප ඉල්ලා සිටී.

ජෝශප් කිෂෝර්

© www.wsws.org